# මාවනැල්ල ප්‍රාදේශීය සභාව

# කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 07 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 මැයි 14 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත් කර තිබූ ඉඩම් හා ගොඩනැගිලි 06 ක වටිනාකම ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 239,156,851 ක් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු. 235,539,714 ක් වූයෙන් රු. 3,617,137 ක වෙනසක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 11,254,610 ක් වූ ලී බඩු හා සවි කිරීම් සම්බන්ධ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,169,593 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,391,546 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත<br>රු. 000 | තථ්‍ය<br>රු. 000 | දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය<br>රු. 000 |
|---|---|---|---|
| (i) වරිපනම් හා බදු | 11,860 | 12,719 | 15,297 |
| (ii) බදු කුලී | 19,452 | 15,813 | 1,535 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,855 | 769 | 134 |
| (iv) වෙනත් ආදායම් | 186,131 | 44,819 | 32,785 |

2.2.2 බදුකුලී

2012 වර්ෂයේ මස් කඩ හා මාළු කඩ 09 ක් බදු දීම සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

2.2.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයට අදාල වෙළඳ බලපත්‍ර ආදායම් බිල් කර නොතිබූ අතර, මුදලින් ලැබී තිබූ රු. 217,802 ක ආදායම පමණක් ගිණුම් ගත කර තිබුණි.

2.2.4 ප්‍රචාරක දැන්වීම් ගාස්තු

සමීක්ෂණ වාර්තාවක් අනුව කොළඹ නුවර මාර්ගයේ සභා බල ප්‍රදේශයේ සවි කරන ලද දැන්වීම් පුවරු 11 ක් වෙනුවෙන් රු. 216,640 ක ගාස්තුවක් අයවිය යුතු වුවද, ඒ සම්බන්ධයෙන් ආදායම් පරිපාලකවරුන් කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 816,750 |
| (ii) මුද්දර ගාස්තු | 30,300,931 |

2.2.6 ජල ගාස්තු

2012 දෙසැම්බර් 31 වන විට පහළ කඩුගන්නාව ජල යෝජනා ක්‍රමයේ පාරිභෝගික ස්ථාන 63 කින් රු. 208,783 ක් අයවීමට තිබුණි. මෙම පාරිභෝගික ස්ථානයන්හි ජල සැපයුම වසර ගණනාවකට පෙර සිට විසන්ධි කර තිබූ අතර හිඟ මුදල අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3 මෙහෙයුම්/ අකාර්යක්ෂමතා

(අ) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා පැවත එන රු. 1,584,789 ක් වූ පැරණි ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ ඖෂධ සඳහා රු. 400,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, අවස්ථා තුනකදී පළාත් සභාව සහ වෙනත් බාහිර ආයතනයන්ගෙන් ලැබුණු ඖෂධ හැර 2012 සැප්තැම්බර් 19 විගණන අවස්ථාව වන විටත් අවශ්‍ය ඖෂධ ලබාගෙන නොතිබුණි. ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ තොග දීර්ඝ කාලයක් හිඟව පවතින අතර ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණි රෝගීන් සඳහා වෙළඳපලෙන් මිලදී ගැනීම සඳහා තුන්ඩු නිකුත් කරන බව අනාවරණය විය.

03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය